කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

**Ministry of Industries**













# බීසීසී ලංකා ලිමිටඩ්

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2023

# බී.සී.සී.ලංකා ලිමිටඩ්

**හැඳින්වීම**

බී.සී.සී.ලංකා ලිමිටඩ් 1988 දී සීමිත වගකීම් සහිත රාජ්‍ය සමාගමක් ලෙස සංස්ථාපිත කරන ලද අතර මහා භාණ්ඩාගාරය සතු කොටස් 10,000,000ක කොටස් ප්‍රාග්ධනයක් සමඟින් 1987 අංක 23 දරන පොදු සමාගම් පනත යටතේ රාජ්‍ය සංස්ථාවක් සහ රජය සතු ව්‍යවසායක් බවට පරිවර්තනය කරන ලදී.

සමාගමේ ප්‍රධාන ව්‍යාපාරය වන්නේ දේශීයව නිෂ්පාදනය කරන ලද ආහාරයට ගත හැකි පොල්තෙල් සහ සබන්, ඩිටර්ජන්ට්, විෂබීජ නාශක සහ අනෙකුත් සබන් ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය, විකිණීම සහ බෙදා හැරීමයි. වත්මන් වෙළෙඳපොළ තුළ, බී.සී.සී. සන්නාමය ඉතා ශක්තිමත් සන්නාම ප්‍රතිරූපයක් ඇති අතර එය බී.සී.සී.සමාගමේ සංවර්ධනයේ විශාලතම බලවේගය වනු ඇත. බී.සී.සී. ලංකා ලිමිටඩ් යනු සබන් සහ සබන් ආශ්‍රිත නිෂ්පාදන සපයන රාජ්‍ය පාලිත එකම සැපයුම්කරුවෙකි. බී.සී.සී. තවමත් කුඩා සහ තෝරාගත් වෙළඳපල කොටසකට ආර්ථික වශයෙන් මිල කළ ගුණාත්මක පාරිභෝගික නිෂ්පාදන ලබා දෙයි. ඒ අනුව, බී.සී.සී. ලංකා ලිමිටඩ්හි සංවර්ධන සැලැස්මේ මූලික පරමාර්ථය වන්නේ සමාගමේ නිෂ්පාදන කටයුතු සුමට කරමින් සමස්ත වෙළඳපොළට බලපෑමක් ඇති කළ හැකි මට්ටමකට එහි විකුණුම් පරිමාව වැඩි කර ගනිමින් සමාගමේ වෙළඳපල කොටස ඉහළ නැංවීමයි.

ගෝලීය වෙළෙඳපොළට ශ්‍රී ලාංකීය පොල් අපනයනය කරන ජනප්‍රියම දේ අතර වියළි පොල්, වර්ජින් පොල්තෙල් සහ පොල් වතුර වන අතර දේශීය 'Drum' නිස්සාරණ ක්‍රමය මඟින් නිෂ්පාදනය කරන මෙරට කෙඳි නිෂ්පාදන සහ පොල් කටුවලින් සාදන ලද සක්‍රිය කාබන් සඳහාද ඉහළ ඉල්ලුමක් පවතී. ශ්‍රී ලංකාව වියළි පොල් සඳහා ලෝක වෙළඳපොලේ ඉතා ජනප්‍රියයි.

එලෙසම, ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සමඟ බෝතල් කළ ආහාරයට ගතහැකි තෙල් වෙළඳපොලෙන් 50%ක් සහ සබන් සහ විෂබීජ නාශක වලින් 25%ක වෙළඳපල කොටස ලබා ගැනීමට සැලසුම් කර ඇත.

සන්නාමගත නිෂ්පාදන අතර බී.සී.සී. සමාගම, තෙල් වෙළඳපොලේ හොඳ පිළිගැනීමක් ඇති අතර සමාගම සහ වෙළඳ නාමය යන දෙකටම සම්බන්ධ හුරුපුරුදුකම සහ හොඳ කීර්තිනාමය වෙත ගමන් කරයි.

මීට අමතරව, වතුපිටිවල ආයෝජන මණ්ඩලයේ (BOI) පරිශ්‍රයේ ඇති සබන් කර්මාන්ත ශාලාව නවීකරණය කිරීමට බී.සී.සී. ලංකා ලිමිටඩ් සැලසුම් කරයි. මෙහිදී බොහෝ අතින් කරන ක්‍රියාකාරකම් වෙනුවට සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය නිෂ්පාදන මාර්ගයක් පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත.

**<u>පොල්තෙල් පිරිපහදුව</u>**

සුදු පොල්තෙල් සහ **කුක්ස් ජෝයි** යන මෙම නිෂ්පාදන දෙකෙහි ප්‍රධාන අමුද්‍රව්‍යය පිරිපහදු නොකළ පොල්තෙල් ලෙස සැලකේ. දැනට බී.සී.සී. ලංකා ලිමිටඩ්, පුද්ගලික අංශයේ කුඩා හා මධ්‍යම සැපයුම්කරුවන්ගෙන් පළමු ශ්‍රේණියේ පොල්තෙල් ලබාගෙන, පෙරීමේ ක්‍රියාවලියක් හරහා බෙදාහැරීමෙන් පසු බී.සී.සී.සන්නාම නාමයෙන් වෙළඳපොළට ඉදිරිපත් කරයි. සාමාන්‍ය පොල්තෙල් පළමු ශ්‍රේණිය පෞද්ගලික අංශය විසින් මිල දී ගෙන, පෙරා, සුදු පොල්තෙල් සහ **කුක්ස් ජෝයි** ලෙස අලෙවි කෙරේ.

සන්නාමගත නිෂ්පාදන අතර බී.සී.සී.තෙල් වෙළඳපොලේ හොඳ පිළිගැනීමක් ඇති අතර සමාගම සහ වෙළඳ නාමය යන දෙකටම සම්බන්ධ හුරුපුරුදුකම සහ කීර්තිනාමය වෙත ගමන් කරයි. වර්තමාන පොල්තෙල් වෙළෙඳපොළ දේශීය සහ ආනයනික පොල්තෙල් යන දෙකෙන්ම සමන්විත වේ. ඒ සමගම බී.සී.සී.පොල්තෙල් සන්නාමය වෙළඳපොලේ විශ්වාසවන්තම පොල්තෙල් සන්නාමය බවට පත්ව ඇත.

**සබන් සහ ඩිටර්ජන්ට් නිෂ්පාදන**

සබන් කර්මාන්ත ශාලාව රෙදි සෝදන සබන්, රූපලාවන්‍ය සබන් බාර් සහ පවිත්‍රකාරක ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කරයි. එම නිෂ්පාදන සහ ඒවායේ වෙළඳ නාම පහත දැක්වේ.

i. ඇඟ ගල්වන සබන් - **සඳුන් සබන්**
   **සුවේන්ද්‍ර මල්** සබන්
   සුවේන්ද්‍ර හර්බල්
   හෙල්ත් ජෝයි සබන්

ii. රෙදි සෝදන සබන් - සවරින් බාර්
   ස්නෝවයිට් සබන්

iii. පවිත්‍රකාරක – **පයිනෝල්**
   **ටොයිලට් බෝල් ක්ලීනර්**

iv. ඩිටර්ජන්ට් – **ඩිෂ් වොෂ් ලික්විඩ්**
   **ඩිෂ් වොෂ් පවුඩර්**

v. **එයාර් ෆ්‍රෙෂ්නර්**

vi. **හැන්ඩ් වොෂ්** (අත් සේදීමේ දියර)

සබන් නිෂ්පාදනයේදී සබන් නූඩ්ල්ස් මූලික අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන අතර ආනයනය කරන රසායන ද්‍රව්‍ය ලබා ගන්නේ සමාගමෙහි ලියාපදිංචි වී ඇති දේශීය වෙළෙඳපොළ සැපයුම්කරුවන්ගෙනි.

**කාර්ය සාධන විශ්ලේෂණය**

සමාගමේ කාර්ය සාධන විශ්ලේෂණය 2017 සිට 2021 දක්වා කාලයට අදාළ සමාගම විසින් ලබා දී ඇති දත්ත මත පදනම්ව සිදු කෙරේ.

**<u>සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්</u>**

- පොල් තෙල් පිරිපහදු කිරීම
- රෙදි සෝදන සහ රූපලාවන්‍ය සබන් නිෂ්පාදනය
- පවිත්‍රකාරක සහ ඩිටර්ජන්ට් නිෂ්පාදනය
- සමාගම විසින් පත් කරන ලද නියෝජිතයන් හරහා "බී.සී.සී." නමින් නිෂ්පාදන දේශීය වෙළඳපොළට බෙදා හැරීම.
- තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාපටිපාටි යටතේ ගිවිසුම් හරහා සුපිරි වෙළඳසැල් එකම මට්ටමේ වෙළඳසැල් සහ ආයතන වෙත ඍජු ගනුදෙනුවක්.
- සීමාසහිත බී.සී.සී. ලංකා ලිමිටඩ් සතු කාර්යාල සහ ගබඩා ඉඩකඩ කුලියට දීම.

**<u>නිෂ්පාදන පෙළ</u>**

බී.සී.සී. ලංකා ලිමිටඩ්හි නිෂ්පාදන කළඹ පහත නිෂ්පාදන පෙළකින් සමන්විත වේ.

- **ආහාරයට ගත හැකි තෙල්:** සුදු පොල්තෙල් සහ කුක්ස් ජෝයි
- ඇඟ ගල්වන සබන්: සඳුන් සබන්, **සුවේන්ද්‍ර මල්** සබන් , සුවේන්ද්‍ර හර්බල්, හෙල්ත් ජෝයි සබන්
- රෙදි සෝදන සබන්**:** සවරින් බාර්, ස්නෝවයිට් සබන්
- පවිත්‍රකාරක**:** පයිනෝල්, **ටොයිලට් බෝල් ක්ලීනර්**
- ඩිටර්ජන්ට්**:** ස්නෝවයිට් ඩිටර්ජන්ට්
- **පිඟන් සෝදන ද්‍රව්‍ය: ඩිෂ් වොෂ් ලික්විඩ් , ඩිෂ් වොෂ් පවුඩර්**
- **හැන්ඩ් වොෂ්** (අත් සේදීමේ දියර)
- **එයාර් ෆ්‍රෙෂ්නර්**

**<u>සමාගමේ වත්මන් වෙළඳපල කොටස සහ නිෂ්පාදන ධාරිතාව</u>**

❖ වත්මන් පොල්තෙල් වෙළඳපොල දේශීය සහ ආනයනික පොල්තෙල් යන දෙඅංශයෙන්ම සමන්විත වන අතර, ශ්‍රී ලංකාවේ ආහාරයට ගතහැකි තෙල් වෙළඳපොල විවිධ වර්ගයේ ෆාම් සහ එළවළු තෙල් වලින් සමන්විත වේ.(ඉරිඟු, සෝයා, ඉඟුරු, රටකජු, තල, ඔලිව්, ආදිය.)

❖ සාමාන්‍ය පවුලක් මසකට පොල්තෙල් ලීටර් 2ක් පරිභෝජනය කරයි යැයි උපකල්පනය කළහොත් ශ්‍රී ලංකාවේ වාර්ෂික ආහාරයට ගතහැකි තෙල් පරිභෝජනය මෙට්‍රික් ටොන් 100,000ක් පමණ වන අතර ඉන් 60%ක් පොල්තෙල් පරිභෝජනය වේ.


❖ ඒ අනුව මෙරට වාර්ෂිකව පොල්තෙල් මෙට්‍රික් ටොන් 60,000කට ආසන්න ප්‍රමාණයක් පරිභෝජනය කෙරෙන අතර මෙම වෙළෙඳපොළේ බී.සී.සී.වෙළෙඳපොළ කොටස සමස්ත වෙළෙඳපොළෙන් 1.8%ක් පමණ වේ.

- වෙළඳනාම අංශයේ බී.සී.සී. වෙළඳපල කොටස 5% ක් පමණ වන අතර, වෙළඳනාම සහිත බෝතල් කළ පොල්තෙල් වෙළඳපොල ෆෝචූන්, එන් - ජෝයි ,මරීනා සහ ටර්කි වැනි සන්නාමයන් විසින් ආධිපත්‍යය දරයි.
- කෙසේ වෙතත්, පොල්තෙල්වල පෝෂ්‍ය පදාර්ථවල සංයුතිය සහ රසායනික අන්තර්ගතය පිළිබඳ දැවැන්ත සැලකිල්ලත් සමඟ, පසුගිය මාස කිහිපය තුළ බී.සී.සී.නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.
- සබන් වෙළඳපොලේ කොටස සම්බන්ධයෙන් ගත් කල, බී.සී.සී.සුහදතාවය වෙළඳපල අල්ලා ගැනීම සඳහා තරමක් ප්‍රයෝජනවත් වේ. කෙසේ වෙතත්, සමාගමේ ප්‍රධාන දුර්වලතාවය නම්, ප්‍රමාණවත් පරිමාණයකින් වෙළඳපොළට බලපෑම් කිරීමට නොහැකි වීම සහ තරඟකාරී නිෂ්පාදන හා සසඳන විට බී.සී.සී.නිෂ්පාදන ආකර්ශනීය නොවන බව ය. බිලියන 21ක ඇස්තමේන්තුගත වාර්ෂික ඉල්ලුමක් ඇති වෙළඳපොළක බී.සී.සී.නියෝජනය පහත පරිදි වේ.

| | 2020/2021 | |
|---|---|---|
| **Product** | **Average Estimated Demand (MT)** | **BCC market share** |
| Beauty Soap | 34000 | 1% |
| Laundry Soap | 30000 | 1.20% |

- බී.සී.සී. ලංකා ලිමිටඩ් සතු බහුතරයක් යන්ත්‍රෝපකරණ ඉතා පැරණි වන අතර යන්ත්‍රවල ධාරිතාව පහත පරිදි වේ. ඒ අනුව එම යන්ත්‍රෝපකරණ වෙනුවට පූර්ණ ස්වයංක්‍රීය යන්ත්‍ර සූත්‍ර ලබාදීමට සමාගම සැලසුම් කර ඇත්තේ නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීමේ ඉහළ අරමුණ ඇතිවය.


| | 2020 | | 2021 | |
|---|---|---|---|---|
| **Production** | **Production Capacity (MT)** | **Average Production (Actual - MT)** | **Production Capacity (MT)** | **Average Production (Actual - MT)** |
| Oil Production | 540 | 250-300 | 1200 | 1000 |
| Soap & Personal Care Production | 600 | 150-200 | 600 | 150-200 |




| Mean (MT) | Median | Standard Deviation |
|---|---|---|
| 504.52 | 432 | 196.30 |

Graph 1


ප්‍රස්ථාර 1 අනුව 2017 සිට 2020 දක්වා කාලය තුළ බී.සී.සී. ලංකා ලිමිටඩ් පොල්තෙල් සහ සබන් නිෂ්පාදනයේ සුළු අඩුවීමක් පෙන්නුම් කරන බව පෙන්වා දෙයි. කෙසේ වෙතත්, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ නිෂ්පාදනය ප්‍රමාණයෙන් 100%කට වඩා වැඩි වී ඇත.




| Mean (Rs. Mn.) | Median | Standard Deviation |
|---|---|---|
| 160.26 | 164 | 29.55 |

Graph 2


ප්‍රස්ථාර 2 අනුව, 2017 වසරේ සිට 2021 දක්වා මුළු නිෂ්පාදන පිරිවැය උච්චාවචනය වී ඇති අතර ඉහළම නිෂ්පාදන පිරිවැය 2021 වර්ෂයේදී සිදු විය.




Graph 3

| Description | Mean (Rs. Mn.) | Median | Standard Deviation |
|---|---|---|---|
| Sales Revenue | 236.31 | 252 | 63.56 |
| Cost of Sales | 160.26 | 164 | 29.55 |
| Gross Profit | 76.05 | 92 | 41.06 |


ප්‍රස්ථාර 3 අනුව බී.සී.සී. ලංකා ලිමිටඩ්හි විකුණුම් ආදායම 2017 වසරේ සිට 2021 දක්වා අඛණ්ඩව ඉහළ ගොස් ඇත. සලකා බලන කාල සීමාව තුළ විකුණුම් පිරිවැය ද උච්චාවචනය වී ඇත. ප්‍රස්ථාරයට අනුව 2017 වසරේ සිට 2019 දක්වා දළ ලාභයේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්වයි. 2020 වසරට සාපේක්ෂව 2021 දී එය සුළු වශයෙන් අඩු වී ඇත.




Graph 4

4 වන ප්‍රස්ථාරයට අනුව 2017 වසරේ සිට 2019 වසර දක්වා පුනරාවර්තන වියදම් අඛණ්ඩව ඉහළ ගොස් ඇති අතර 2020 වර්ෂයේදී සුළු වශයෙන් අඩු වී ඇත. සලකා බලන කාල සීමාව තුළ වැටුප් සහ වේතන, අනෙකුත් දීමනා උච්චාවචනය වී ඇත. වැටුප් සහ වේතන පුනරාවර්තන වියදම් වලින් 30% - 48% නියෝජනය කරයි.


| Description | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| **Recurrent Expenditure** | **71** | **84** | **90** | **73** | **90** |
| **Salaries and Wages** | 21 | 25 | 31 | 35 | 29 |
| **Other Allowances** | 1 | 1 | 1 | 2 | 2 |




Graph 5

| Description | Mean (Rs. Mn.) | Median | Standard Deviation |
|---|---|---|---|
| Net Profit before tax | 23.26 | 22 | 15.43 |

බී.සී.සී. ලංකා ලිමිටඩ්හි විකුණුම් පිරිවැය වැඩිවීම සහ අනෙකුත් ආදායම්වල අඩුවීම හේතුවෙන් 2018 වසරේ බදු පෙර ශුද්ධ ලාභය හදිසියේ පහත වැටී ඇති බව 5 ප්‍රස්ථාරයෙන් දැක්වේ. නමුත් 2019 වසරේ සිට සමාගමේ බදු වලට පෙර ශුද්ධ ලාභය ක්‍රමයෙන් වැඩි විය.




බී.සී.සී. ලංකා ලිමිටඩ් සමාගමේ මුළු සේවක සංඛ්‍යාව 2017 වසරේ සිට 2021 දක්වා සේවකයන් 42 සිට සේවකයන් 50 දක්වා ඉහළ ගොස් ඇත.

**<u>නිරීක්ෂණ සහ නිර්දේශ</u>**

- පොල්තෙල් වල පෝෂ්‍ය පදාර්ථවල සංයුතිය සහ රසායනික අන්තර්ගතය පිළිබඳ දැවැන්ත සැලකිල්ලත් සමඟ, පසුගිය වසරවල බී.සී.සී. සමාගම ආහාරයට ගත හැකි තෙල් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.
- බී.සී.සී. සමාගමට, සබන් නිෂ්පාදන වෙළඳපල කොටස අත්පත්කර ගැනීම  වෙළඳපලතුල කීර්තිනාමය නංවාලීම සඳහා ප්‍රයෝජනවත් වේ.
- බී.සී.සී.සන්නාම නාමයේ විශ්වාසනීයත්වයේ වාසිය ලබා ගැනීමෙන්, සමාගමට ඉහළ ලාභයක් ලබා ගැනීමේ විශාල අවස්ථාවක් ඇති බැවින් ලාභදායිත්වය ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
- 2017 වර්ෂයේ සිට 2022 දක්වා නිෂ්පාදන කාර්ය සාධනය අනුව නිෂ්පාදන හා විකුණුම් පිරිවැය ද ඉහළ මට්ටමක පවතී. මක්නිසාද යත් එම හේතු නිසා දළ ලාභ ප්‍රමාණය එතරම් ඉහළ මට්ටමක නොතිබූ බැවිනි. එබැවින් නිෂ්පාදන හා විකුණුම් යන දෙකෙහිම පිරිවැය අඩු කිරීමේ ක්‍රම භාවිතා කිරීමට සමාගමට සිදු වේ.
- බී.සී.සී.ලංකා ලිමිටඩ් සමාගමේ සුභදතාවයේ දියුණුවත් සමඟ, සමාගම අනාගතයේ දී වඩා හොඳ ලාභයක් සහ ස්ථාවරත්වයක් ලබා ගැනීමට හේතු වන අගය එකතු කළ නිෂ්පාදන සමඟ නව වෙළඳපල ගවේෂණය කිරීමට උත්සාහ කර ඇත.